# රුව ගුණ වඩවන
## යහගුණ කැටිවුන
# කහ

- වගා කිරීම
- වගා නඩත්තුව
- අස්වනු සැකසීම

- වගාවට පෙර ඔබේ ඉඩම ගල් වැටි, කණු හා ජීවී වැටි යන පාංශු හා ජල සංරක්ෂණ උපක්‍රම යොදා ඉඩම සංවර්ධනය කරන්න.
- වැඩි ආදායමක් සඳහා යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත් යොදා පරිසර හිතකාමීව වගාව මනාව නඩත්තු කරන්න.

TURMERIC

*Curcuma longa*

**වැඩි විස්තර දැනගන්න**
**විමසන්න**


**අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිළධාරී**
සෑම බදාදා දිනකම ප්‍රදේශයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දී

**සහකාර අධ්‍යක්ෂ**
අපනයන කෘෂිකර්ම දිස්ත්‍රික් කාර්යාල වල දී

**අපනයන කෘෂිකර්ම තොරතුරු කේන්ද්‍රය-ගැටඹේ**
දුරකතන අංක 0812-388651

dea.information2017@gmail.com
www.exagri.info

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, පේරාදෙණිය. දුරකතන 081-2388651



සැකසුම : මාධ්‍ය හා සන්නිවේදන අංශය

## කහ වගාකරමු

උද්භිත විද්‍යාත්මකව Curcuma domestica (කර්කයුමා ඩොමෙස්ටිකා) ලෙස හඳුන්වන කහ බෝගය සින්පිබරේසියේ කුලයට අයත් වේ. පිලිකා නාශක ගුණයකින් යුත් කහ සඳහා ඉහළ ආර්ථික වටිනාකමක් ඇති අතර ආහාර සැපයීමේ දී ද, විෂබීජ නාශකයක් හා ආයුර්වේද ඖෂධයක් මෙන්ම රෙදිපිළි වර්ණ ගැන්වීම සඳහා ද, රූපලාවන්‍ය කටයුතු සඳහා ද බහුලව භාවිතා වේ.

දේශීය පරිභෝජනය සඳහා වසරකට වියළි කහ මෙට්‍රික් ටො. 6800 ක් පමණ අවශ්‍ය වේ. 2017 වසරේදී ද දේශීය අමු කහ නිෂ්පාදනය මෙ. ටො. 10000 ක් පමණ වූ අතර දේශීය අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා වියළි කහ මෙ. ටොන් 5000 ක් පමණ ආනයනය කිරීමට රු. මිලියන 1000 ක් පමණ වැය වී තිබේ.

## ශ්‍රී ලංකාවේ වගා කරන ප්‍රදේශ

කුරුණෑගල. මහනුවර, මාතලේ. ගම්පහ, කොළඹ, කෑගල්ල, නුවරඑළිය, කළුතර, ගාල්ල, මාතර, බදුල්ල, රත්නපුර, මොණරාගල, පොළොන්නරුව, අම්පාර ජල සම්පාදනය යටතේ වියළි කලාපයේ තෝරා ගත් ප්‍රදේශ වල හා අතරමැදි කලාපයේදී වගා කල හැකිය.

## කහ බෝගයේ ප්‍රභේද

දේශීය කහ, ගන්ටර්, පූනා, මදුරාසි මන්ජල්, ඇල්පී

## කහ වගාව සඳහා සුදුසු දේශගුණික අවශ්‍යතා

| | |
|---|---|
| වාර්ෂික වර්ෂාපතනය | - මි.මී. 1500 - 1750 |
| මුහුදු මට්ටමේ සිට උස | මී. 1500 ක් දක්වා |
| උෂ්ණත්වය | සෙ.ශ්‍රේ. 20-30 |

## වගා ආරම්භය

මාර්තු, අප්‍රේල් යන මාස වලදී බීජ අල සිටුවයි.

## කහ බීජ අල අවශ්‍යතාවය

හෙක්. 1 කට කහ බීජ අල කි.ග්‍රෑ. 1500-2000 ත් අතර
(අක්කරයට බීජ අල කි.ග්‍රෑ. 600 - 800 අතර)

## බිම් සැකසීම

අඩි 1 ක් ගැඹුරට පස පෙරළා කැට පොඩි කරගත යුතුයි. අඩි 5ක් පළලට තමන් කැමති දිගකට පන්ති සකස් කර ගත් පාත්ති වලට දිරූ කාබනික පොහොර සත්ව පොහොර හා පිලිස්සූ දහයියා අඟුරු යොදා හොඳින් පස් සමග මිශ්‍ර කරගත යුතුයි.




## බීජ කහ සිටුවන පරතරය

- පැල අතර පරතරය - මී. 0.3 (අඩි 1)
- පේළි අතර පරතරය - මී. 0.3 (අඩි 1)
- එක් පන්තියකට පේළි 3ක් වන සේ බීජ කහ අල සිටුවා ගත යුතුය.

## කහ සිටුවීම

- එක් ස්ථානයක කහ බීජ අල ග්‍රෑම් 50-100 ක් පමණ හා ඇඟිලි අල 2 - 4 ක් වන පරිදි සිටුවිය යුතුය.
- අඟල් 1ක පස් තට්ටුවකින් සිටුවන ලද කහ අල වසා අතින් තද කර ඒ මතට වසුන යොදන්න.
- වසුන් සඳහා දහයියා. පිදුරු හෝ පොල් අතු භාවිතා කළ හැක, මාස 3ට වරක් වසුන අලුත් කර ගත යුතුයි.

## නඩත්තු කටයුතු

පැළ පාමුලට පස් එකතු කිරීම වරින් වර සිදු කළ යුතුයි. එමඟින් කහ අල ආලෝකයට විවෘත නොවන ලෙස තබා ගත යුතුයි

කහ පැළ පේළි අතර රනිල ශාඛ පත්‍ර හෝ කොළ හොහොර සඳහා ගන්නා ශාක අතු කැබලි අතුරා ඒ මතට දිය කළ ගොම දියර ඉසින්නී

මාස 3 කට වරක් කාබනික පොහොර පේළි අතර විසිරුවා හැර පසට කලවම් කරන්න.

## පොහොර යෙදීම (හෙක්ටයාරයකට) (අක්කර 2 1/2 ට)





### සිටුවා මාස 1.5 - 2 (දින 45)

| | |
|---|---|
| යූරියා | - කි.ග්‍රෑ. 65 |
| මියුරියේට් ඔෆ් පොටෑස් | - කි.ග්‍රෑ. 100 |

### සිටුවා මාස 3 - 5 (දින 90)

| | |
|---|---|
| යූරියා | - කි.ග්‍රෑ. 65 |
| මියුරියේට් ඔෆ් පොටෑස් | - කි.ග්‍රෑ. 100 |

අමිශ්‍ර පොහොර ගෙන මිශ්‍ර කර කහ පැල පේළි අතර යොදා පස් සමඟ මිශ්‍ර කර පිදුරු, දහයියා වැනි වසුනක් භාවිතා කර පස ආවරණය කරන්න.

## රෝග හා පළිබෝධ

### කඳ විදින දළඹුවාගේ හානිය

පොළොවට ආසන්නව අඟල් 3ක් පමණ ඉහලින් කඳ සිදුරු කර ඇති බව දැකිය හැකිය. එයට තවත් අඟල් 4 ක් පමණ ඉහලින් තවත් සිදුරක් තිබේ නම් එය පණුවා සළඹයෙකු වී පිටවී ගිය සිදුරයි.

### පාලනය

වගාව හොඳින් පරික්ෂා කර බලා එහි සිදුරු සහිත කඳන් දැකිය හැකිනම් සිදුරට පහලින් කපා පුළුස්සා දැමිය යුතුය. එමඟින් පැතිරීම පාලනය කළ හැකිය.

### කොළ පුල්ලි රෝගය

කහ පත්‍රවල තැනින් තැන සුදු පැහැති ප්‍රදේශ ඇති වී ඒවා දුඹුරු පාටට හැරේ. මෙලෙස කහ පත්‍ර මත දුඹුරු පුල්ලි දැකිය හැකි වේ.

### පාලනය

මෙම දිලීර රෝගය සඳහා 1% බෝඩෝ මිශ්‍රණය යෙදිය හැකිය.

### අල කුණුවීමේ රෝගය

කදේ පාදස්ථ කොටසට හා රෙසෝමවලට ආසාදනය වන දිලීර රෝගයකි.
පත්‍ර ධාරය වියළි පසුව පත්‍ර සහ මුළු ශාකයම වියළී ගස කඩා වැටේ.

### පාලනය

බීජ අල සිටුවීමට පෙර පස ජීවාණුහරණ කිරීම, බීජ අල 0.3% ක මැන්කොසෙබ් දිලීර නාශක ද්‍රාවණයේ විනාඩි 30 ක් ගිල්වා තබා පවනේ වියළා සිටුවීම, රෝග වගාවන් සඳහා 0.3% මැන්කොසෙබ් දිලීර නාශකය ඉසීම.

## අස්වනු නෙළීම

කහ පත්‍ර වියළී ගිය විට අප උපරිම ලෙස මෝරා ඇති අතර අස්වනු මේ අවස්ථාවේ දී නෙළා ගත හැක. මේ සඳහා බීජ අල සිටුවා මාස 9 ක් පමණ ගතවේ.
සාමාන්‍ය අස්වනු නෙළන කාලය ජනවාරි - මාර්තු

කහ හෙක්ටයාරයකට වගාවකින් අමු කහ අල මෙට්‍රික් ටොන් 15 - 20 ක් පමණ ලබාගත හැක.

## ප්‍රධාන නිෂ්පාදනය

අමු කහ, වියළි කහ, වියළි කහ කුඩු,
වියළි කහ පෙති, සහ ඔලියෝරෙසීන, කහ තෙල්

## අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් සපයන සේවා

වගා කරන බීජ කි.ග්‍රෑම් ගණන අනුව වගා නඩත්තුව සඳහා ආයෝජන ආධාර සපයනු ලැබේ.



*අවු කොටු පිරී රටක් - අනම්ට සරු හෙටක් සඳහා අපනයන කෘෂි බෝග වවමු.*


Written By : Ruwan Basnayake
Designed By : Prasanna Thilakarathne
Asha Lakmali